

# මනමේ කුමරියගේ මෙල්බන් සම්ප්‍රාප්තිය

රොහාන් නෙත්සිංහ

සිංහල නාට්‍ය සම්ප්‍රදායක් බිහිකරමින්, නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා පුරෝගාමීත්වය ගෙන මහඟු සේවයක් ඉටුකල යුග පුරුෂ කෙනෙක් වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අනුස්මරණීය දසවන සංවත්සරය මෙම වසරෙහි යෙදී තිබේ. එතුමා අප අතරින් වියෝ වූවද, ඔහු විසින් කරන ලද සදා අමරණීය එම නිර්මාණ පෙළ නාට්‍ය කලාව නිතැතින් පෝෂණය කරනු ඇත.

මනමේ නාටකයේ එන මනමේ කුමරියගේ චරිතය නිරූපනය පිළිබඳ සිතන විට නිතැතින්ම මතකයට එන්නේ බොහෝ කලක් මුළුල්ලේ එම චරිතය ඉදිරිපත් කළ මහාචාර්ය  සරච්චන්ද්‍රයන්ගේ කනිටු දියණිය යශෝදරා සරච්චන්ද්‍රයි. මීට හේතුව ඇය සහ එම චරිතය එතරම්ම සමීප ලෙස රසික හදවත් තුළ රැඳී තිබීමයි.

මෑතකදී යශෝදරා සරච්චන්ද්‍ර සිය පවුලත් සමඟින් ස්ථිර පදිංචිය සඳහා මෙල්බන් නුවරට පැමිණීම මෙහි වෙසෙන කලාකාමී ශ්‍රී ලාංකික ජනතාවට අළුත් සුබ ආරංචියකි. කුසුම්සිරි ලියනආරච්චි යශෝදරාගේ ස්වාමි පුරුෂයායි. ඔහු මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය බොහෝමයක චරිත නිරූපණය කල ප්‍රතිභාපූර්ණ නළුවෙකි. ඉහත සඳහන් වූ මනමේ නාටකයේ මනමේ කුමරු චරිතයද මහාසාර නාටකයේ වැදිරියගේ චරිතයද ඔහු විසින් නිරූපනය කරන ලදී.
නරිබෑනා හි නරියාගේ චරිතයද, ජසයා හා ලෙංචිකා හි ජසයාගේ චරිතය ද, කාලගෝල නාටකයේ මහෞෂධ පන්ඩිතයින්ගේ චරිතයද ඔහු රඟපාන ලද සුවිශේෂ චරිත අතර වෙයි.

ජයලත් මනෝරත්න ගේ සඳගිර, තලමල පිපිලා, ගුරු තරුව යන නාට්‍යවල චරිත නිරූපනය කළ ඔහු දයානන්ද ගුණවර්ධන, ලූෂන් බුලත්සිංහල, ලතා සුභසිංහ, රන්ජිත් ධර්මකීර්ති වැනි ප්‍රවීණ නාට්‍යය අධ්‍යක්ෂකවරුන්ගේ හා ප්‍රසන්නජිත් අබේසූරිය, ඉන්දික ෆර්ඩිනෑන්ඩෝ වැනි තරුණ පරපුරේ නාට්‍යය අධ්‍යක්ෂක වරුන්ගේද නිර්මාන වලටද රංගනයෙන් දායක වී ඇත.

ශ්‍රී ලංකාවේ 1996 වසරේ ප්‍රථම වරට පැවැත්වූ රාජ්‍ය ළමා නාට්‍ය උළෙලෙහි හොඳම පිටපතට, හොඳම නාට්‍යය, අධ්‍යක්ෂණයට හිමි රාජ්‍ය සම්මාන කුසුම්සිරි නිශ්පාදනය කළ "ඔක්කොමලා කොල්ලකාලා" නාට්‍යයට හිමිවිය. 1994, 1995, 1996 වර්ෂ වල ජාතික තරුණ සේවා සභාව මගින් පැවැත්වූ නාට්‍යය උළෙලවල් හා තරඟාවලි වල හොඳම අභිරූපණ ශිල්පියාට හිමි සම්මාන ඔහු විසින් දිනා ගන්නා ලදී.
1998 වසරේ රාජ්‍ය ළමා නාට්‍ය උළෙලෙහි හොඳම නළුවාට හිමි සම්මානය කුසුම්සිරි නිරූපනය කළ "චොකලට් බබා" චරිතයට පිරිනැමුණු අතර නැවත වතාවක් 1999 වසරේ රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල නියෝජනය කරමින් හොඳම අධ්‍යක්ෂණය, හොඳම පිටපත, හොඳම නිෂ්පාදනයට හිමි සම්මාන ඔහුගේ " සපත්තී" නාට්‍යය සඳහා පිරිනමන ලදී.
සිනමාකරණය, නාට්‍ය කලාව, නැටුම් යන විෂයයන් ප්‍රගුණ කල කුසුම්සිරි කැලණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා විශේෂ උපාධිධාරියෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ලේඛකත්ව හා ජන සංනිවේදන ඩිප්ලෝමාවක්ද හිමි ඔහු කුඩා කල සිටම නැටුම් කලාව හදාරා ඇත.

ඔහු ශ්‍රී ලංකා රූපවාහිණියට ද, නාට්‍ය කිහිපයක්ම තිර රචනා කොට ඇති අතර රාජ්‍ය කෙටි චිත්‍රපට උළෙලට නිෂ්පාදනය කොට ඉදිරිපත් කළ " අම්මා" කෙටි චිත්‍රපටය තෝරාගත් චිත්‍රපට දහයෙන් එකක් නියෝ ජනය කලහ.

යශෝධරා සරච්චන්ද්‍ර වයස අවුරුදු නමයේදී වෙස්සන්තර නාට්‍යයෙන් ප්‍රසිද්ධ වේදිකාවට පිවිසියාය. ප්‍රේමතෝ ජායතී ශෝබෝ (සෝකෝ)  නාට්‍යයේ හැරුණු විට මහාචාර්ය සරච්චන්ද්‍රයන් නිර්මාණය කළ අනෙක් සියළුම නාට්‍යයවල ප්‍රධාන චර්ත ඇය විසින් රඟ දක්වන ලදී. සෝමලතා මුණසිංහ ගේ ''විකෘති'' නාට්‍යයේ ද ඇය චරිතයක් නිරූපණය කලාය.

බව කඩතුරාව නාට්‍යයෙන් හොඳම සහාය නිළියට හිමි සම්මානය දිනාගත් ඇය ශ්‍රී ලංකා - ජපාන මිත්‍රත්ව සංග්‍රාමය නාට්‍ය සඳහා පිරිනමන ''බුංකා'' සම්මානය 2000 වසරේ දී



දිනා ගත්තාය. කොළඹ දේවි බාලිකා වි්‍යාලයේ මූලික අධ්‍යාපනය ලැබූ ඇය ඉන්දියාවේ දිල්ලි සරසවියේ සමාජ වි්‍යා විශේෂ උපාධිධාරිණියක් වන අතර කොළඹ සරසවියේ ''ජපන් අධ්‍යාපන කටයුතු පිළිබඳ'' පශ්චාත් ''කලාශූරී'' උපාධියක් ලබා ඇත.
ප්‍රංශ, ස්පාඤ්ඤ, ජපන් භාෂාවන් අධ්‍යනය කල ඇත චිත්‍රසේන යටතේ නැටුම් කලාව හැදැරුවාය. තවද ඇය සංගීත විශාරදවරියක් වන අතර ඩී.බී. වික්ට පෙරේරා ගෙන් ගායනය හා සිතාර් වාදනය, දේවගේ යන ගුරුවරු යටතේ ප්‍රගුණ කර ඇත.
ශ්‍රී ලංකා කැළණිය විශ්ව වි්‍යාලයේ සමාජ වි්‍යා අංශයේ කථිකාචාර්වරියක ලෙස සේවය කොට වැඩිදුර අධ්‍යාපනය සඳහා 2001 වසරේ නවසීලන්තයට පිටව ගියාය.

පසුගිය දිනෙක ඔස්ට්‍රේලියාවේදී ඔවුන් මට හමුවූ අතර එහිදී තොරතුරු මෙලෙස විමසුවෙමි.

- කවදාද මෙහේ ආවේ?
- දැන් මාස තුනක් විතර වෙනවා. මමයි කුසුම්සිරියි, පුතායි අපි තුන්දෙනාම මෙහේ ස්ථිර පදිංචියට ආවා.
- මෙහේ එන්න පෙර හිටියේ නවසීලන්තයේ නේද. එහේ මොනවාද කලේ.

34 වන පිටට



# ඇංජලිකා සහ අපේ සිනමාවේ නවරැල්ල

වසන්ත පී. ඕපනායක

මේ දිනවල ශ්‍රී ලංකාවේ සිනමාහල්වල ප්‍රදර්ශනය වන "අංජලිකා" චිත්‍රපටය මෙල්බර්න් නගරයේ ජීවත් වන අපටද කල්තියාම නැරඹීමට අවස්ථාවක් පසුගිය සති අන්තයක්දී උදාවිය. .
චිත්‍රපටය පිළිබඳව කිසිදු පූර්ණ විමර්ශනයකින් තොරව මා සිනමා ශාලාව වෙත ගියේ දීර්ඝ කාලයකට පසු චිත්‍රපටයක් නැරඹීමට තිබූ ආශාව නිසාත්, චිත්‍රපටය නිපදවූ ආකාරය පිළිබඳව චන්න පෙරේරා සමග සති අන්ත ගුවන් විදුලි  මාධ්‍යය මගින් කරනු ලැබූ පිළිසඳරට සවන්දීමේ සෘජු ප්‍රතිඵලයකුත් නිසාවෙනි.
සිනමා ශාලාව අසල පෙල ගැසී සිටි ප්‍රේක්ෂක පිරිස දෙස හා ඉන් අනතුරුව සිනමා ශාලාව අතුරු සිදුරු නොමැතිව පිරී ඉතිරී ගිය සේයාවෙන්, මෙම චිත්‍රපටය නම් ඉතා සිත් ඇදගන්නා සුළු චිත්‍රපටයක් විය හැකි බව කල්තියාම සනාථ කෙරිණ.
චිත්‍රපට දර්ශණය අවසානයේදී ඒ කෙරෙහි මා සිත් ඇද බැද ගත් ආකාරය කොතෙක්ද යත් මෙම සටහන ලියා එවීමට තරම් මා උත්සුක විය.

"අංජලිකා" සම්භාව්‍යය ගනයට අයත් චිත්‍රපටයක් නොවේ. එය හුදෙක්ම නරඹන්නන්ට විනෝදාශ්වාදය ලබා දීමේ අරමුණෙන් නිෂ්පාදනය කරන ලද චිත්‍රපටයකි. මෙහි සැබෑ ලෙසම ගැඹුරු සමාජ අර්ථකථන දෙන ආකාරයේ කථා වස්තුවක්ද නොමැත. වෙනදා මෙන් ඇග හිරිවැටී යන අශෝබන දර්ශන, වාද විවාද, හා සීමාවකින් තොරව දිගහැරෙන හරඹ ඇතුළත් දර්ශන අඩංගු නොවේ. එහෙත් මෙය පවුලේ අය සමඟ එකට සිට රසවිඳිය හැකි ඉතාමත්ම සරල අහිංසක ආදරයක් පිළිබිඹු කරන කතා වස්තුවක් පෙරදැරිකර ගෙන තනන ලද වාණිජමය චිත්‍රපටයකි. මෙය තරුණ තරුණියන් සඳහා සැබෑ ලෙසටම ඉල්ලුමට සැපයුම ලබාදීමට සමත් නවීන පන්නයේ තාක්ෂණය උපයෝගී කරගෙන සකස් කරන ලද චිත්‍රපටයකැයි කීම ඉතා නිවැරදිය.
එසේ නම් මෙම චිත්‍රපටය ශ්‍රී ලංකාවේ චිත්‍රපට ශාලාවට හෝ එහි ශිල්පීන්ට අභියෝගයක් විය හැක්කේ කවර කරුණක් නිසාද?

සිනමාව ඕනෑම ජන සමාජයකට තදින්ම ඇඟ බැදලූ මාධ්‍යයකි. එමගින් සමාජයේ ඉදිරි ගමන කෙරෙහි මහත් බලපෑමක් එල්ල කල හැකි බව අද බටහිර සහ ඉන්දියානු චිත්‍රපට ක්ෂේත්‍රවල විකාශය දෙස බැලීමේදී මනාව වටහා ගත හැකිය. අපගේ සිංහල සිනමාවටද මෙලෙස පෙරලිකාර යුගයක් පැවති බව 1960-70 දශක වල නිපදවූ චිත්‍රපට නැරඹූ අපි දනිමු. විවිධ සමාජ සිදුවීම් අලලා නිෂ්පාදනය වූ මෙම චිත්‍රපට තුළින් සමාජ විෂමතා, සමාජ අසාධාරණකම්, රට තුළ වූ දේශපාලනය, සාමාන්‍යය ජන ජීවිතය සහ වඩාත් ඉදිරියෙන් ප්‍රේම වෘතාන්ත වැනි දෑ ඉතා ප්‍රබල ස්ථානයක් ලබාගත් අතර එමගින් සමාජයට ලබාදුන් බලපෑම අති මහත්ය. මෙනයින් වඩාත්ම බලපෑමක් එල්ල වී තිබුනේ සමාජ ස්ථරයේ පහලම කොටස ලෙස සැලකෙන තරුණ තරුණියන් ඉලක්ක කොට නිපැයූ ඉහත කී ප්‍රේම වෘත්තාන්ත චිත්‍රපට මඟිනි. මේ සඳහා සිනමා ක්ෂේත්‍රය තුළ සුවිශේෂ ගණයේ කලාකරුවන් බිහිවී තිබීම සහ නිර්මාණකරුවන්ගෙන් පිරී පැවතීමද මෙයට විශාල පිටුවහලක් වූ බවද පෙනේ.

එහෙත් අවාසනාවකට මෙන් පසුගිය දශක දෙක තුළ අප රටේ චිත්‍රපට ක්ෂේත්‍රය මුළුමණින්ම අර්බුදයකට ලක්වූවා පමණක් නොව ජනතාවගේද ඒ කෙරෙහි තිබූ ඇල්ම, විශ්වාසය පහව ගියබව අපි දනිමු. මේ සඳහා බලපා ඇති සාධක ලෙස ප්‍රධාන වශයෙන් රට තුළ සිදුවූ මහා පරිමාණ ආර්ථික වෙනස්කම්, රූපවාහිනිය හඳුන්වාදීම, දිනෙන් දින දියුණු වන ඉන්දියානු සිනමාවේ බලපෑම වැනිදෑද පෙන්වාදිය හැකි ය.
මෙවන් වකවානුවක "අංජලිකා" චිත්‍රපටය මා දකින්නේ, මා ඉහතින් සඳහන් කල මුල් යුගයට නෑකම් කියන ඉතාමත්ම සරල හා සැකසුරුවම් කමින් නිපදවූ චිත්‍රපටයක් ලෙසයි.

චිත්‍රපටය සඳහා යොදාගත් ප්‍රධාන නිලි චරිතයට පන පොවන දකුණු ඉන්දියානු නිලි "පූජා" ගේ දක්ෂ සිත් ඇද ගන්නා රඟපෑම හමුවේ මෙම චිත්‍රපටය ශ්‍රී ලංකාවේ තරුණ තරුණයින් ඇලුම් කරන ඉන්දියාවේ බොලිවුඩ් ගණයේ චිත්‍රපටයකට සමාන ආකර්ශනයක් මෙම චිත්‍රපටයට ලැබී ඇතැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවේ. මෙයට යොදා ඇති තාක්ෂණය ප්‍රධාන චරිතය රඟපෑ චන්න පෙරේරාගේද දක්ෂ යෞවන රඟපෑම සහ අනෙකුත් මූලාංග සියල්ලමද එහි සාර්ථකත්වයට බලපෑ ඇති බව සහතිකය.

සමාජයේ විවිධ තරාතිරම්වල ජීවත්වන ජන පිරිස් තම රැකී රක්ෂා හා එදිනෙදා වගකීම් ඉෂ්ඨ කිරීමෙන් පසු ඉඳහිට හෝ සිනමා ශාලාවකට පිය නගනුයේ තරමක  මානසික රසාස්වාදයක් ලබා ගැනීමේ අභිලාශයෙනි. මේ අරභයා වානිජමය චිත්‍රපට මගින් විශාල මෙහෙයක් සිදුකල හැකි බව අපි දනිමු. එහෙත් ජනතාවගේ මේ රසිකත්වය පිළිබඳව වරදවා වටහා ගත් කූට සිනමාකරුවන්ද අප රටේ සිටිනා බව පසුගිය දශක දෙක තුළ නිෂ්පාදනය වූ බොහෝමයක් චිත්‍රපට නැරඹීමේදී පෙනීයයි.

"අංජලිකා" නැරඹීමට යාමේදීද මා තුළ නිරායාසයෙන් සිතට ඇතුලු වී තිබූ ඉහත කී අවිනිශ්චිත භාවයයි. එහෙත් චිත්‍රපටයේ ප්‍රධාන නිලි "පූජා" ගේ පළමු දර්ශන කීපය තිරය මත දිග හැරෙද්දීම මාගේ එම අවිනිශ්චිත භාවය කෙමෙන් කෙමෙන් පහව යන්නට විය. ඇය අපට තදින්ම සිනමාපටය වෙතට සිත් යා කර තබා ගැනීමට සමත් විය. ඇය අප පැරනි ගම්බද තරුණියක තුළ වූ දඟකාරකම, කෙලිලොල් බව මෙන්ම අහිංසකකම මනාව නිරූපනය කිරීම තුළින් එය නරඹන යෞවන යෞවනියන්ගේ මෙන්ම අප කාගේත් සිත් ඇය කෙරෙහි ආකර්ශනය කර ගැනීමට සමත් විය.
ඇගේ චරිතය කෙරෙහි සිත් තුළ පහල වූ දැඩි සානුකම්පිත ඇල්ම හා චිත්‍රපටයට ලබා දී තිබූ ඉන්දියානු මිශ්‍රනය මගින් එකතු වූ ආඩම්බරිත හැඟීමත් සමග බොහෝ ඇස් කඳුලු වලින් තෙත්වීමට පටන් ගැණින. අප සැමදෙනාම එහි සෑම රූප රාමුවක් දෙසම නෙත් යොමාගෙන බලා සිටියේ "අංජලිකා" ට අප හදවත් තුල ඇති කිරීමට සමත් වූ දැඩි සානුකම්පිත සෙනෙහසද සමගය.
ඇයත් සමඟ යෞවනකම මනාව පිලිඹිබු කරමින් රංගනයක යෙදුනු චන්න පෙරේරාටද ප්‍රේක්ෂක සිත් සතන් යා කර තැබීමට හැකියාව තිබීම මෙහි ඇති අපූර්රත්වය තවත් විදහාපාන්නකි.

ගාමිණී ෆොන්සේකා, මාලනී ෆොන්සේකා, ජෝ අබේවික්‍රම වැනි කලාකරුවන් පසුකලෙක ප්‍රවීන සිනමාකරුවන් බවට පත්වීමටද ඉවහල් වූයේද මෙම අප නැරඹූ සුන්දර වානිජ චිත්‍රපට කලාවෙන් ලද ආභාශය මත බව අප අමතක නොකල යුතුය.

දැන් අප චිත්‍රපට ක්ෂේත්‍රය ඉදිරියේ ඇති අභියෝග නම් (කසිකබල් වානිජ චිත්‍රපට වෙනුවෙන් ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබා ගත හැකි) සාර්ථක වාණිජ චිත්‍රපට බිහිකිරීමට දේශීය සම්පත් උපයෝගී කර ගැනීමයි. "අංජලිකා" චරිතය එයට සම්මතයක් ලෙස උපයෝගී කර ගැනීම නිවැරදි මිනුම් දණ්ඩක් විය හැකිය. චිත්‍රපටයේ රඟපාමින් "පූජා" අපට දී ඇති පණිවිඩයද එයයි. බොහෝ ජනයා ප්‍රිය කරන්නේද එයයි.

අවසාන වශයෙන් චන්න පෙරේරා තරුණ කලා කරුවෙකු ලෙස අගය කිරීමට මා තුළ හට ගත්තේ ඔහු, ඔහු පිළිබඳවම වරින්වර විවරණයක යෙදුණු අවස්ථාවේ සිටමය. කලාකරුවනට ඔහුගේ හෝ ඇයගේ නිර්මාන බිහි කිරීමට වෙහෙස මහන්සි වනවා සේම ඔවුනට දිනා ගැනීමටද යමක් ඇත. ඒ කලා රසික ජනතාවයි. ඔවුන් එය දැකිය යුත්තේ ඔවුන් ඉදිරියේ ඇති මහා පර්වතයක් ලෙසිනි. එය තරණය කිරීම සඳහා කෙටි මාර්ග නොමැත. ඇත්තේ තව තවත් නිර්මාණ බිහි කිරීම පමණකි. තම නිර්මාණ ඉදිරියේ තබාගෙන, නිර්මාණ පසු පසින් ගමන් කරන කලාකරුවන් සැබෑ කලාකරුවන් ලෙස ජනතාවගේ ගෞරවයට පාත්‍ර වනවා නිසැකය. තම නිර්මාණ පසෙකලා වහ වහා ජනතාව අතරට රිංගා යාමට මාන බලන ව්‍යාජ කලාකරුවන්ට චන්නගෙන් ඉගෙන ගතහැකි පාඩම් බොහෝය. ඔහු වචනයේ අර්ථයෙන්ම සමාජය තුළ ජනතාව අතරටම වී තම නිර්මාණ බිහිකිරීමට අධිශ්ඨාන කරගත් සැබෑ කලාකරුවෙකි. ඔහුට යාමට තවදුර බොහෝය. අප ඔහු ධෛර්යමත් කල යුතුය.